# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2326/29 - 2023 අප්‍රේල් මස 04 වැනි අඟහරුවාදා - 2023.04.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1973 අංක 25 දරන ක්‍රීඩා පනත**

1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 32 (ආ) සහ 33 වගන්ති යටතේ සාදන ලද නියමයන්

ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍ය රොෂාන් රණසිංහ වන මම, 1973 අංක 25 දරන ක්‍රීඩා පනත හා සංශෝධන අනුව 32 (ආ) සහ 33 වගන්ති යටතේ මා වෙත පවරා ඇති බලතල ප්‍රකාරව පාපන්දු ක්‍රීඩාව සඳහා වන ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනයේ ලියාපදිංචිය තාවකාලිකව අත්හිටුවන අතර, තාවකාලික කාර්යය ක්‍රමයක් වශයෙන් එකී ජාතික ක්‍රීඩා සංගම්/සම්මේලනයන්හි පරිපාලන හා වෙනත් යම් අවැසි කටයුතු සහ අදාළ නිලවරණයන් කැඳවීමට හා පැවැත්වීමටත් එතෙක් යථායෝග්‍ය අයුරින් ඉටු කිරීම උදෙසා 2023 අප්‍රේල් මස 04 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල්වරයා නිසි බලධරයා ලෙස මෙයින් පත් කරමි.

**රොෂාන් රණසිංහ** (පා.ම),
ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍ය.

2023 අප්‍රේල් මස 04 වැනි දින,
කොළඹ දී ය.

EOG 04 - 0052

1A - G 39298 — 08 (2023/04)
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*